## iii මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ විධිවිධාන

ලංකාව වැනි ආර්ථික අතින් නොදියුණු රටක මහ බැංකුවට මුහුණ පාන්නට ඇති ආවේනික දුෂ්කරතාවන් 1958 පාලන වාර්තාවෙන් පෙන්වා දෙන ලදි. ගිය අවුරුද්දේ පාලන වාර්තාවෙහි විශේෂයෙන් සඳහන් කළ පරිදි, ලංකාවේ මහ බැංකුවට අවහිර වන ප්‍රධාන කරුණු දෙක නම් මුදල් වෙළඳ පොලෙහි ඇති නොදියුණු තත්වයත්, රටේ ආර්ථික තත්වය නියම කරවන ප්‍රධාන කරුණු මහ බැංකු පාලනය යටතේ නොවීමත්ය. මෙයින් රජයේ අය වැය ප්‍රතිපත්තියෙන් වූ බලපෑම 1959 දී, පෙර වර්ෂයන්ට වඩා අධික විය. මහ බැංකුවට පාලන ප්‍රතිපත්ති පිළිබඳ ක්‍රියා මාර්ගයන්, සාර්ථක ලෙස අනුගමනය කිරීමට, රජයේ අය වැය හා අනිකුත් ප්‍රතිපත්තීන් නිසා, 1959 දී දුෂ්කර විය. අනික් අංශ පිළිබඳ රජයේ ක්‍රියා මාර්ගයන්ගේ සහයෝගය නොමැතිව, මහ බැංකුවකට තම මුදල් ප්‍රතිපත්තියේ වගකීම් ක්‍රියාත්මකව ඉටු කිරීමට හැකි වේද යන්න නොයෙකුත් රටවල විවාදයට භාජනව පවතී. 1959 දී ලංකාවේ පැවති දේශපාලන අස්ථිරතාව නිසා මුදල් පාලන ප්‍රතිපත්ති ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මකව සහයෝගය දීමට රජයට නොහැකි විය.

1959 යේ මහ බැංකු ප්‍රතිපත්ති උද්ගත වූයේ, එකිනෙකට වෙනස් වුව ද, කිට්ටු සම්බන්ධයක් ඇති මුදල් පාලනය පිළිබඳ ප්‍රශ්න දෙකක් වටාය. එනම් රජයේ අවදනම් මුදල් තත්වය සහ ශීඝ්‍රයෙන් පහළ බැස ගිය විදේශීය වත්කම්ය. ප්‍රශ්න දෙක එකිනෙකට වෙනස් වන්නේ එකක් අයවැය ප්‍රශ්නයක් වන අතර, අනික ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ ප්‍රශ්නයක් නිසාය. එකිනෙකට සම්බන්ධ වන්නේ, රජය මුදල් අමාරුකම් මඟහරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග නිසා විදේශීය වත්කම් ශීඝ්‍රයෙන් පහළ වැටුණු බැවිනි. මේ ප්‍රශ්න දෙක හැර අනික් ප්‍රශ්නය වූයේ, වෙළඳ බැංකුවල ද්‍රවශීල තත්ත්වය ආරක්ෂා කිරීමට මහ බැංකුවෙන් ණය ගැනීමය. නමුත් මේ ණය ගැනීම ගිය අවුරුද්දේ මෙන් මේ අවුරුද්දේ අවශ්‍ය නොවීය.

මේ වාර්තාවේ ඉහත දී සාකච්ඡා කළ පරිදි, 1959 දී රජයේ මුදල් ප්‍රශ්නය උද්ගත වූයේ අය වැය හිඟයන් පියවීම උදෙසා රජය අනුගමනය කළතත්වානුරූප නොවන ප්‍රතිපත්ති නිසාය. විදේශීය ආධාර ගැන රජයේ තුබුණු බලාපොරොත්තු කඩවීමෙන් ඇති වූ මුදල් අමාරුකම් ආදායමෙහිත් වියදමෙහිත් පරතරය අඩු කිරීමෙන් හෝ විදේශීය ණය ගැනීම වැඩි කිරීමෙන් හෝ මේ දෙකින් ම හෝ මඟ හරවා ගැනීමට ඉඩ කඩ තිබිණි. මේ ගැන පහත සාකච්ඡා කෙරේ.

අවුරුද්ද තුළ දී මහ බැංකුව, මුදල් පිළිබඳ රජයේ අනුශාසකයා ලෙස අය වැය හිඟයන් පියවා ගැනීමේ ක්‍රම කිහිපයක් ම නැවත නැවතත් යෝජනා කළේය. නමුත් නොයෙකුත් හේතූන් නිසා, රජය මේ යෝජනා සමහර විට අතපසුකළේය. සමහර විට නො කර හැරියේය. 1959 ජුලි මාසයේ කළ අය වැය යෝජනා හැර, ආදායම් වැඩි කිරීම සඳහා 1959 දී කළ එකම දෙය නම්, සැප්තැම්බරයේ සහ නොවැම්බරයේ දෙවතාවක් ම රබර් නිර්යාත බද්ද වැඩි කිරීමය. රබර් තීරු බද්දේ මේ වැඩි කිරීම ඇති වූයේ වර්ෂයාවසානයේ දී බැවින් එයින් 1959 දී රජයේ මුදල් තත්ත්වයට වැඩි යහපතක් සිදු නොවීය. අනෙක් අතින් ආදායමෙන් අය විය යුතු වියදම් ප්‍රමාණයෙහි කෝටි 8.5ක වැඩිවීමක් ඇති විය. ණය අරමුදලින් වියදම් නොවී, රුපියල් කෝටි 17.6ක මුදලක්, ඉතිරි වීම ආර්ථික වර්ධනයෙහි සතුටුදායක ලක්ෂණයක් නොවුන ද එය අය වැය පරතරය අඩු කර ගැනීමට උදව් විය.

1958/59 යේ රුපියල් කෝටි 41.3ක් වූ ශුද්ධ අය වැය හිඟය, දළ වශයෙන්, ගිය අවුරුද්දේ මෙන් දෙගුණයෙකි. 1959/60 වේ මුල් කාර්තුව තුල රජයේ මුදල් අවශ්‍යතාවය, 1958/59 මුල් කාර්තුවට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය.

මේ නිසා 1959 යේදී රජයේ ණය ගැනීම් 1958 වේ ප්‍රමාණයට වඩා බොහෝ සෙයින් වැඩි විය. රජයේ මෙ තරම් විශාල වූ ණය ගැනීම් සපුරා ලීමට බැංකු–නොවන අංශයට නො හැකි වුව ද, 1958 ට වඩා විශාල ප්‍රමාණයක මුදලක් රජයේ ණය පත් මගින්, රජයට දෙන ලදි. සැළකිය යුතු මේ වැඩි වීමට හේතූන් මේ වාර්තාවේ මුල් අංශවල විග්‍රහ කොට ඇත. මේ හේතූන් අතුරෙන් එකක් වූයේ සාමාන්‍ය වෙළඳ පොලෙන් ණය ලබා ගන්නා රජයේ උකස් බැංකුව සහ ජාතික නිවාස අරමුදල, 1959 දී ණයකර නිකුත් නොකිරීමය. 1959 යේ වූ රජයේ මුදල් අවශ්‍යතාවන් ගේ අධික වීම නිසා මේ ආයතනවලට කෙළින් ම වෙළඳ පොළින් ණය නොගෙන ඔවුන්ගේ මුදල් අවශ්‍යතාවන් මහා භාණ්ඩාගාරයෙන් හෝ අන් තැනෙකින් ගැනීමට මහ බැංකුව විසින් පිළියෙළ කරන ලදි.

වෙළඳ බැංකුවල ද්‍රවශීල තත්වය 1958 ට වඩා තරමක් දියුණු අතට හැරුනේය. ඒ නිසා බැංකුවල රජයේ ණය පත් 1958 දීට වැඩි ප්‍රමාණයක් තබා ගැනීමට හැකි විය. නමුත් මේ ද්‍රවශීල තත්වය රජයේ ණය පත් විශාල ප්‍රමාණයක් තබා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීය. මේ

හෙයින් තව ද නොපියවුන අය වැය හිඟය සඳහා මුදල් අවශ්‍ය විය. ණය ගැනීමට වෙන මාර්ගයක් නොතිබුනෙන් රජය විසින් මහ බැංකුවෙන් ණය ගැනීමෙන් මේ හිඟය පියවන ලදි. මුදල් පණතේ 88 වැනි වගන්තිය ප්‍රකාර රජයට මහ බැංකුවෙන් දිය හැකි අවක්‍ර ණය දීම් ඇස්තමේන්තු කළ ආදයමෙන් සියයට දහයකට සීමා කර ඇත. මේ සීමාව යටතේ ලබා ගැනීමට ඉතිරිව තුබූ මුදල් මද වූ බැවින්, රජය විසින් අවශ්‍ය මුදල්, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් මහ බැංකුවෙන් ලබා ගන්නා ලදි. (මෙය 1959 දී රුපියල් කෝටි 13.3ක් පමණ විය.) 1959 දී රජය මෙසේ සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් ලබා ගත්තේ ය. අවුරුද්ද තුල නොගෙවූ භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය රුපියල් කෝටි 25.5කින් වැඩි විය. මේ කාලය තුල දීම, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්හි වටිනාකම රුපියල් කෝටි 19.15කින් වැඩි විය. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම පිළිබඳ ව්‍යවස්ථාපිත සීමාව අප්‍රෙල් මාසයේ දී රුපියල් කෝටි 20.0 සිට කෝටි 35.0 දක්වා ද, ඊට පසුව ඔක්තෝබර් මාසයේ දී කෝටි 45 දක්වා ද පාර්ලිමේන්තු සම්මුතියෙන් නංවන ලදි. 1959 අවසානයේ දී නොගෙවූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 42.0ක් විය. 1960 ජනවාරි අවසානයේ දී එය ව්‍යවස්ථාපිත සීමාව වූ රුපියල් කෝටි 45.0ට නැංගේය.

මෙසේ උද්ධමනාත්මක ක්‍රමයට රජයේ අය වැය පියවීමේ ප්‍රතිඵලය වූයේ භාණ්ඩ සහ සේවා සඳහා වියදම අධික ලෙස වැඩි වීමය. මෙසේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාණ්ඩ සහ සේවා සඳහා කෙළින් ම රජය කළ වියදම් වැඩිවීමත්, පෞද්ගලික ආදයම් ඉහළ යාමත් යන කරුණු දෙකය. මේ වැඩි වූ වියදමට සරිලන පරිදි නිෂ්පාදනය කොතෙක් දුරට වැඩි වී දයන්න ගැන පැහැදිලි නිගමනයකට බැසීමට සෑහෙන සංඛ්‍යා තොරතුරු නොමැත. එනමුදු රජයේ වියදම් ඉහළ යාම නිසා ආයාත සැළකිය යුතු ලෙස වැඩි විය.1959 යේ ආයාත, වාර්තා වී ඇති ඉහළම ප්‍රමාණය වෙයි. මේ කාලය තුල නිර්යාත ආදයම වැඩි නමුත්, විදේශීය වත්කම් සැළකිය යුතු ප්‍රමාණයකින් පහළ වැටුනේය. වර්ෂය තුළ දී පහළ බැස ගිය සම්පූර්ණ විදේශීය වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 19.45ක් විය.

ජාත්‍යන්තර ගනුදෙනු සහ විදේශීය වත්කම් කෙරෙහි රජයේ මුදල් ප්‍රතිපත්තිය අසතුටුදයක ලෙස බලපාන බව මහ බැංකුව දැන සිටිය ද, ව්‍යවස්ථානුකූලව රජයේ නියෝජිතයා වශයෙන් රාජ්‍ය ණය පරිපාලනය කිරීම, මහ බැංකුවේ යුතුකම වූ බැවින් අය වැය ලේඛනයේ වියදම් සැපයීම සඳහා භාණ්ඩාගාරය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ වගකීම මඟ හැරීමට මහ බැංකුවට නො හැකි විය. අලුතෙන් පණවන ලද අයබදු වලින් සම්පූර්ණ ඵල නෙලීමට කාලයක් ගත වන බව ද, මහ බැංකුව සැළකිල්ලට ගෙන තිබුනේය. කෙසේ හෝ තම ව්‍යවස්ථාපිත වගකීම් ගැන සැළකිලිමත් වූ මුදල් මණ්ඩලය විසින්, උද්ගත වෙමින් පවත්නා තත්වයේ ආවේනිකව ඇති අවදනම් තත්ත්වයගැන රජයට නැවත නැවතත් අවවාද කරන ලදි.

ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ වූ බලපෑම විශේෂයෙන් අය වැය ප්‍රතිපත්තිය නිසා ඇති වූවකි. වෙළඳ බැංකුවලින් පෞද්ගලික අංශයට කළ ණය දීම් ප්‍රමාණයෙහි වැඩිවීම, රජයේ අය වැය හිඟයන් උද්ධමනාත්මක ලෙස පියවීම හා සසඳන විට ඉතා අඩු බැවින්, ඔවුන් විසින් දෙන ලද ණය ප්‍රමාණය කපා හැරීම නුසුදුසු යැයි මහ බැංකුව විසින් සලකන ලදි. පෞද්ගලික අංශයට දෙන ණය සීමා කිරීමෙන්, නිෂ්පාදන වියදම් සහ ජීවන වියදම ඉහළ යාමේ අයහපත් විපාක ගැන ද මහ බැංකුවේ අවධානය යොමු කෙරිණ. මේ හේතුන් නිසා පෞද්ගලික අංශයට වෙළඳ බැංකු විසින් දෙන ණය, විදේශීය වත්කම් තත්වය ඉතා අවදනම් නොවන තුරු, සීමා කිරීම ගැන මහ බැංකුව විරුද්ධ විය.

1959 ජූලි මාසයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 1959/60 මූලික අය වැය ඇස්තමේන්තුවලින් අය වැය හිඟයන්ගේ මට්ටම පහළ බස්වනු ඇතැයි අපෙක්ෂා කරන ලදි. එනමුදු 1958/59 මුදල් වර්ෂය අවසාන වන්ට පළමුව, අංශ කිහිපයකම (සමහර ප්‍රාග් ධන සහ ජංගම මුදල් පිට රට යැවීම් පිළිබඳ සීමා කිරීම් ගැන ගෙන තිබෙන විනිමය පාලන විධිවිධානයන් ඇතුළුව) ක්‍රියා මාර්ගයන් ඊළඟ මුදල් වර්ෂයේ මුල් භාගයේ දී සැළකිල්ලට භාජනය කළ යුතු යයි රජය සහ මහ බැංකුව විසින් අදහස් කරන ලදි. නමුත් 1959 සැප්තැම්බර් සහ නොවැම්බර් මාස අතර වූ දේශපාලන අස්ථිරතාවය නිසා මෙ වැනි නිසි ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉඩ නො ලැබුනේය.මේ අතර, 1959 යේ ඔක්තෝබර් මාසයේ දී රුපියල් කෝටි 2.5 ණයක් ගත්වි නමුදු, භාණ්ඩාගාරයට, එහි පවත්නා වියදම පියවීමට ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් අධිකව නිකුත් කිරීමට සිදු විය. නමුත් මේ අමතර භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රමාණවත් ටැන්ඩර් නොලැබුනා පමණක් නොව, දෙසතියෙන් දෙසතියට මේරූ භාණ්ඩාගාර බිල්පත් බේරීමට අවශ්‍ය මුදල් ද නොතිබිණි. 1959 දෙසැම්බර් 15 වැනිද භාණ්ඩාගාර බිල්පත් පොලිය සියයට 2.03කට නැංගේය. 1959 දෙසැම්බර් 16 වැනිද ආර්ථික සහ මුදල් තත්වය සලකා බැලූ මුදල් මණ්ඩලය, බැංකු පොලිය සියයට 2½ සිට සියයට 3 දක්වා වැඩි කළේය. තවත් ණයක් ගැනීමට යෝජනා කිරීමටත්

විශේෂ මුදල් පාලන විධිවිධාන කීපයක් ක්‍රියාවේ යෙදීමටත් මුදල් මණ්ඩලය බලාපොරොත්තු විය. නමුත් 1959 දෙසැම්බර් 23 වැනිදා මහ බැංකු පොලී වැඩි කිරීමට මුල දී කැමැත්ත පළ කළ මුදල් ඇමතිවරයා, මුදල් පණතේ 115 වැනි කොටසේ 2 වැනි ඡේදයට අනුව, වැඩි කළ බැංකු පොලී ප්‍රමාණය පෙර මට්ටමට ම ගෙනෙන ලෙස මුදල් මණ්ඩලයට නියෝග කළේය.

## මුදල් පණතේ 115 (2) ඡේදය

''මුදල් මණ්ඩලයේ ප්‍රතිපත්තීන් ලංකාවේ මහ ජනයාගේ උසස් ම යහපත තකා යොමු කරන ලද්දක් ද යන්න පිළිබඳ මත භේදයක් මණ්ඩලය හා මුදල් ඇමතිවරයා අතර ඇති වුවහොත් මුදල් ඇමතිවරයා හා මණ්ඩලය ඒකමතිකත්වයකට පැමිණීමට උත්සාහ කළ යුතුය. මෙසේ මණ්ඩලයට හා මුදල් ඇමතිවරයාට ඒකමතිකත්වයට පැමිණීමට නොහැකි නම්, මුදල් ඇමතිවරයා ආණ්ඩුවේ කැමැත්ත පරිදි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳ ව වගකීම ආණ්ඩුව මගින් භාර ගන්නා බව මණ්ඩලයට දන්වා, ඒ ප්‍රතිපත්තිය පිළිගැනීමට විධාන කරනු ඇත. මුදල් ඇමතිවරයා විධානයක් කළ විට, මණ්ඩලය ඒ විධානය ක්‍රියාවේ යෙදවිය යුතුය.''

මෙයට අනතුරුව මුදල් මණ්ඩලය, 1959 දෙසැම්බර් 24 වැනිදා මහ බැංකු පොලී ප්‍රමාණය සියයට 2½ දක්වා අඩු කළේය. බැංකු පොලී ප්‍රමාණය අඩු කිරීම නිසාත් මුදල් ප්‍රතිපත්තිය කෙරෙහි රජය දැක්වූ අදහස නිසාත්, මුදල් පාලනය පිළිබඳ මහ බැංකුව අදහස් කර තුබුණු ක්‍රියා මාර්ගයන් අත්හිටවීමට සිදු විය.

රාජ්‍ය ණය පිළිබඳ ප්‍රතිපත්තියෙන්, පෞද්ගලික ආයෝජකයින්ගෙන් හැකි පමණ ණය ගැනීමට මහ බැංකුව පෙර මෙන් කටයුතු කළේය. 1959 දී පෞද්ගලික අංශයෙන් ලබා ගනු ණය ප්‍රමාණය වැඩි වූ අතර, ඉතිරිකිරීම් තව දුරටත් උනන්දු කරවීම අත්‍යාවශ්‍ය යැයි සලකනු ලැබීය. 1959 සැප්තැම්බර් මාසයේ දී, මහ බැංකුව ජාතික ඉතිරි කිරීම් ව්‍යාපාර කොමසාරිස්තුමා සමඟ කළ සාකච්ඡාවකට අනතුරුව ජාතික ඉතිරි කිරීමේ ව්‍යාපාරය ශක්තිමත් කිරීම පිළිබඳ අවශ්‍ය යෝජනා කීපයක් ඉදිරිපත් කළේය.

රජයට ණය මුදල් වැඩි වැඩිව අවශ්‍ය වීම නිසා, රාජ්‍ය ණය පත්හි පොලී ප්‍රමාණය වැඩි කිරීමෙන් රජයට වැඩියෙන් ණය මුදල් ලබා ගත හැකි දැයි යන්න ගැන මහ බැංකුව කලක සිට පරීක්ෂාකාරීව සිටියේ ය. කෙටි කාලීන ණය ගැනීම් සම්බන්ධයෙන් මුදල් වෙළඳ පොලේ පැවතුන සාමාන්‍ය හිඟය නිසා භාණ්ඩාගාර බිල්පත් පොලිය ක්‍රමයෙන් ඉහළ ගියේය. ජනවාරියේ දී සියයට 1.71ක් වූ මෙය ජූනි මාසයේ දී සියයට 2.0ක් විය. ජූනි මාසයට පසු භාණ්ඩාගාර බිල් පත් වෙළඳ සැපයුම තරම් වැඩි නොවීය. එබැවින් දෙසතියට වරක් කැඳවන ටැන්ඩරයේ වැඩි කොටසක් මහ බැංකුවට මිලට ගැනීමට සිදු විය. භාණ්ඩාගාර බිල්පත් වැඩි කොටස මහ බැංකුව විසින් මිලට ගත්, ජූනි මාසයෙන් පසු කාලය තුළ දී, බිල්පත් පොලී ප්‍රමාණය සියයට 2ක්ව පැවතුනේය. නමුත් දෙසැම්බර් මාසයේ දී, භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වෙළඳ පොලේ ඉල්ලීම දියුණු විය. දෙසැම්බර් 13 වැනිදා පොලී ප්‍රමාණය සියයට 2.03ට වැඩි විය. වර්ෂය අවසානයේ දී එය සියයට 2.08 දක්වා ඉහළ ගියේය.* රාජ්‍ය ණයපත් පොලී වැඩි කිරීමෙන් කෙටි කාලීන ණය ගැනීම් මගින් වැඩි ණය ප්‍රමාණයක් ලබා ගැනීමට නො හැකි බව මහ බැංකුව විශ්වාස කළ ද, දීර්ඝ කාලීන ණය ගැනීම් සම්බන්ධව ණයපත් පොලිය වැඩි කිරීමෙන් අත්හදා බැලීමට මහ බැංකුව උනන්දු විය. මේ අදහසින් 1959 දී මහ බැංකුව රාජ්‍ය ණය පත් පොලී ප්‍රමාණ සම්බන්ධව වැදගත් වෙනසක් ඇති කළේය. මෙතෙක් සියයට 3¾ක් වූ වර්ෂ 16–20 ණයකරයක පොලී ප්‍රමාණය, 1959 නොවැම්බර් මාසයේ දී නිකුත් කරන ලද 1975–79 ලංකාණ්ඩු ණයකර සම්බන්ධව සියයට 3½ කරන ලදි. දීර්ඝ කාලීන ආයෝජන අවශ්‍යතාවන් සඳහා සෑහෙන ප්‍රමාණයක ඉතිරිකිරීම් ලබා ගැනීමට දැනට පවත්නා පොලී ක්‍රමය උඩ පුළුවන් වන්නේ ද යන්න තව දුරටත් පරීක්ෂා කර බැලිය යුතුව ඇත.

## මහ බැංකුව විසින් වෙළඳ බැංකුවලට දෙන ලද ණය.

ඉහත සඳහන් කළ පරිදි වෙළඳ බැංකුවල ද්‍රවශීල තත්ත්වය සම්බන්ධයෙන් ද 1959 දී මහ බැංකුවට ක්‍රියා කිරීමට සිදු විය. මුදල් වෙළඳ පොලේ පැවති හිඟය නිසා බොහෝ විට වෙළඳ බැංකුවලට මහ බැංකුවෙන්, ණය ගැනීමට සිදු විය. නමුත් මේ ණය ගැනීම් පසුගිය වර්ෂයට වඩා අඩු විය. වර්ෂය තුල දී වෙළඳ බැංකු ණය දීම් ප්‍රමාණය ඉතා අඩු වශයෙන් වැඩි වූ නිසා ද ඉන් වැඩි කොටසක් අවශ්‍ය ආයාත හා නිර්යාත සඳහා වූ නිසා ද, විය. වෙළඳ බැංකුවලට, පවත්නා පොලී ප්‍රමාණය අනුව, රාජ්‍ය ණය පත් ඇප කොට ණය ලබා ගැනීමට මහ බැංකුව ඉඩ දුන්නේය.

* 1960 මාර්තු 15 වෙනිදා භාණ්ඩාගාර බිල්පත් පොලිය තවදුරටත් සියයට 2.43 තෙක් [නැංගේය.

## විදේශීය ණය ගිවිසුම්

1959 වර්ෂය තුල දී රජය විසින් ඇති කර ගන්නා ලද පහත සඳහන් විදේශීය ණය ගිවිසුම් සම්බන්ධයෙන් මහ බැංකුවෙන් උපදෙස් ඉල්ලන ලදි.

(1) 1959 මාර්තු 25 වැනිද රාජ්‍ය නීති 480 යටතේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නිර්යාත-ආයාත බැංකුවත් සමඟ ඩොලර් කෝටි .22ක ණය ගිවිසුමක් ඇති කර ගන්නා ලදි. අමෙරිකා එක්සත් ජනපදයේ ඩොලර්වලින් පොලී ගෙවන්නේ නම් අවුරුද්දකට සියයට 4ක පොළියක් ද මෙ රට මුදලින් ගෙවන්නේ නම් අවුරුද්දකට සියයට 5ක පොලියක් ද මේ ණය සඳහා අය වේ. ණය මුදල අර්ධ වාර්ෂික, කොටස් වශයෙන් 1963 ඔක්තෝබර් 1 වැනිද සිට අවුරුදු 26ක් තුල දී ගෙවිය යුතුය. ඩොලර් 1,055න් පටන් ගන්නා වාර ගෙවුම ක්‍රමයෙන් වැඩි වී ඩොලර් 97,982ක වාර මුදලකින් අවසන් වේ.

(2) 1959 සැප්තැම්බර් 23 ද රාජ්‍ය නීති 480 යටතේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නිර්යාත-ආයාත බැංකුවක් සමඟ ඩොලර් කෝටි 0.586ක ණය ගිවිසුමක් ඇතිකර ගන්නා ලදි. මේ ණය මුදලෙහි වාර්ෂික පොලී ප්‍රමාණය සියයට 3½කි. පළමු වැනි ණය කොටස ලබා වර්ෂ 4කට පසුව ණය බේරීම ඇරඹේ. මෙය අර්ධ වාර්ෂික වාර මුදලින්, තිස් අවුරුදු කාලයක් තුල දී ගෙවිය යුතු ය. මුල් වාර මුදල ඩොලර් 2,957ක් ද අවසාන වාර මුදල ඩොලර් 2,54,804ක් ද වේ.

(3) යුගෝස්ලේවියානු ඒකාබද්ධ මහජන සමූහාණ්ඩුවෙන් රන්පවුම් කෝටි 0.55ට සමාන ණය මුදලකි. මේ ණයෙන් සියයට 90ක් ම ලංකාවට යුගෝස්ලේවියාවෙන් සපයන ප්‍රාග් ධන භාණ්ඩයන් සඳහා යොදවනු ලැබේ. ඉතිරි සියයට 10, බඩු ගෙන්වන්නන් විසින් ගිවිසුම අත්සන් කළ දිනය සහ අවසාන බඩු තොගය ලැබුන දින අතර දී ගෙවිය යුතුය. මේ ණය මුදල අර්ධ වාර්ෂික වාර ගෙවීම්වලින් අට අවුරුද්දකට නො වැඩි කාලයක් තුළ දී ගෙවිය යුතු ය. එක් එක් වෙළඳ ගිවිසුම යටතේ ලබා ගන්නා ලද ණය සම්බන්ධව පොලී ප්‍රමාණය සියයට 3කි. අවසාන බඩු තොගය එවා මාස හයක් ඉකුත් වූ විට මුල් වාර ගෙවීම කළ යුතු ය. 1959 දී මේ ගිවිසුම යටතේ කිසිම ණයක් ලබා නැත.

(4) පොදු රාජ්‍ය මණ්ඩලීය ආධාර ණය යෝජනා ක්‍රමය යටතේ, එක්සත් රාජධානියෙන් රන් පවුම් 25,00,000ක (රුපියල් කෝටි 3.5කට සමාන) ණය මුදලක් ලබා ගැනීමට සාකච්ඡා අවසාන කොට ඇත. මේ ණය දිවයිනේ ටැලිෆෝන් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය උපකරණ මිලයට ගැනීම සඳහා යොදවනු ලැබේ. මේ ණය සඳහා එක්සත් රාජධානිය විසින් ණයක් ගැනීමේ දී ගෙවිය යුතු පොලිය සහ පාලන වියදම් වශයෙන්, සියයට එකකින් හතරෙන් එකක් ද, පොලී වශයෙන් ගෙවිය යුතුය. ණය බේරීම, උපකරණ සැපයීමේ දිනයේ සිට, වාර මුදලින් අවුරුදු පහක් ඇතුලත දී කළ යුතුය.

## ජාත්‍යන්තර මුදල් කටයුතු

1959 දී ජාත්‍යන්තර අරමුදලේ ලංකාවේ සහභාග කොටස ඩොලර් කෝටි 3.0කින් වැඩි කරනලදී. මෙයින් සියයට 25ක් රන්වලින් ගෙවන ලදි. මේ වැඩිවීම සිදු වූයේ 1959 සැප්තැම්බර් මාසයේ දීය. දැනට අරමුදලේ ලංකාවේ කොටස ඩොලර් කෝටි 4.5කි. මේ කොටස් ප්‍රමාණය වැඩි කිරීම, ජාත්‍යන්තර ගනුදෙනු අවාසි වීමෙන් උද්ගත විය හැකි දුෂ්කරතාවන් මඟහරවා ගැනීමට වැඩිපුර ණය මාර්ගයක් වශයෙන් ලංකාවට ප්‍රයෝජනවත් වේ.

සාමාජික රටවල් සියල්ලගේ ම කොටස් වැඩි වීම අරමුදලේ ජාත්‍යන්තර ක්‍රියාකාරිත්වයේ නම්‍යතාවය වැඩි කරයි. තව ද සාමාජිකයන්ට වැඩි ණය ලබා ගැනීමට ද, අරමුදලේ රන් සංචිතය වැඩි කර ගැනීමට ද එය උපකාර වේ. මෙසේ ජාත්‍යන්තර ණය පහසුකම් වැඩිවීම සාමාජික රටවල අත්‍යාවශ්‍ය ප්‍රශ්නයන් නිරාකරණය කර ගැනීමට උපකාරී වේ. ලෝක ආර්ථික ක්‍රියාකාරිත්වය දියුණු කිරීමට ද ඉවහල් වේ. ජාත්‍යන්තර අරමුදලට ලංකාවේ කොටස වැඩි කිරීමත්, සමගම ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන බැංකුවට ලංකාවේ දායක දීමනාව ද ඩොලර් කෝටි 6.0කින් වැඩි කරන ලදි.